# ප්‍රතිමා නැති විදුලි කෙටීම

ඇතැම් පඬිවරු බුද්ධඝෝෂ හිමියනට පෙර මෙරට සිංහල බසින් ලියන ලද අටුවා තිබිණි ය යන්න විශ්වාස නොකරති. ඔවුන්ට අනුව හෙළටුවා යනු හෙළ (සිංහල) බසින් ලියන ලද අටුවා නොව සිංහල දේශයේ ලියන ලද අටුවා වෙයි. මෙය නව මතයක් විය හැකි නමුත් එය කරුණු සහිත ව පෙන්වාදීමට ඒ පඬිවරු අපොහොසත් වෙති. ඔවුන්ට ඒ සඳහා කීමට ඇති එකම කරුණ අනුරාධපුර මුල් යුගයෙහි සිංහල භාෂාව එතරම් දියුණු නැතැයි යන උපකල්පනය පමණකි. එහෙත් මිහිඳු හිමියන් දේවානම්පිය තිස්ස රජුට පමණක් නොව මෙරට එකල විසූ සියළු දෙනාට ම දහම් දෙසා ඇත්තේ සිංහලෙන් ය. සිංහලෙන් දහම් දෙසීම ගැන කියැවෙන්න පිළිබඳ ව මේ පඬිවරුන්ට කීමට ඇත්තේ එක් දෙයකි. ඔවුහු ඒ කතාව ප්‍රතික්ෂේප කරති. එවිට ඔවුන් පවසන්නේ මාගධී ප්‍රාකෘතය හා එකල සිංහල අතර එතරම් වෙනසක් නොතිබූ බැවින් මිහිඳු හිමියන් මාගධී ප්‍රාකෘතයෙන් දහම් දෙසුව ද ඒ අවබෝධ කරගැනීමට මෙරට වැසියන්ට අපහසුවක් නොවූ බව ය. මෙය එක්තරා ආකාරයකින් ගතහොත් ප්‍රවාදයක් ද වෙයි. අපි මේ ප්‍රවාදය පිළිබඳ ව කෙටි විමසුමක් කරමු. ඒ සමග එයට අදාළ ව යෙහෝවා දෙවියන් වහන්සේ ගැන ද සාකච්ඡා කරමු.

ඉහත සඳහන් ප්‍රවාදය බටහිර විද්‍යාවේ දක්නට ඇති ආකාරයේ වියුක්ත සාධාරණ (පොදු - general) ප්‍රවාදයක් නොවේ. මෙය නිශ්චිත කරුණක් පිළිබඳ ව ඇති සංයුක්ත ප්‍රවාදයක් පමණකි. ප්‍රවාද යනු සංයුක්ත වේවා, වියුක්ත වේවා කතන්දර බැවින් මෙය ද කතන්දරයකි. වියුක්ත ප්‍රවාදයක් ගොඩනැගෙන්නේ වියුක්ත සංකල්ප ආධාර කරගනිමිනි. උදාහරණයක් ලෙස නිව්ටන් පඬිවරයාගේ නමින් ඇති ගුරුත්වාකර්ෂණ ප්‍රවාදය ගනිමු. එහි දී ප්‍රශ්නයක් වෙයි. ඒ ප්‍රශ්නය නම් පොල් (ඇපල්) පොළොවට වැටෙන්නේ ඇයි ද යන්න ය. ඒ සමග හඳ පොළොව වටා යන්නේ ඇයි ද යන්නත් පොළොව ඇතුළු ග්‍රහ වස්තූන් ඉර වටා යන්නේ ඇයි ද යන්නත් විය. ගුරුත්වාකර්ෂණ ප්‍රවාදයෙන් පිළිතුරු ලැබෙන්නේ මේ ප්‍රශ්නවලට ය. මෙහි දී ප්‍රශ්නයට භාජනය වන්නේ සාධාරණ කරුණකි. එය එක් පොල් ගෙඩියක් පමණක් හා සම්බන්ධ වූ ප්‍රශ්නයක් නොවේ. ප්‍රශ්නය සියළු පොල් ගෙඩි සම්බන්ධයෙනි. වර්තමානයෙහි තිබෙන පොල් ගෙඩි ගැන පමණක් නොව අතීතයෙහි තිබූ පොල් ගෙඩි ගැන ද අනාගතයෙහි තිබිය හැකි පොල් ගෙඩි ගැන ද ප්‍රශ්නය වලංගු වෙයි. එපමණක් නොව පොල් හැරෙන්නට වෙනත් ගෙඩි වර්ග සම්බන්ධයෙන් ද ප්‍රශ්නය අදාළ වෙයි. ගස්වලින් වැටෙන වස්තු සම්බන්ධයෙන් පමණක් නොව ගල් කැට වැනි උඩ දමන (ප්‍රක්ෂේපණය කෙරෙන) වස්තු සම්බන්ධයෙන් ද ඒ ප්‍රශ්නය ඇසිය හැකි ය. එපමනක් නොවේ. පොළොවේ ඇති වස්තුවලින් පිටතට ගොස් ඉර, හඳ, තාරකා, ග්‍රහ වස්තු වැනි ඛගෝලීය (celestial) වස්තු සම්බන්ධයෙන් ද අදාළ ප්‍රශ්න ඇසිය හැකි ය.

මේ ප්‍රශ්නයට පිළිතුරක් වුයේ ගුරුත්වාකර්ෂණ ප්‍රවාදයයි. තවත් පිළිතුරක් වුයේ සාධාරණ සාපේක්ෂතාවාදයයි. ඒ ප්‍රශ්නයට තවත් පිළිතුරු වෙයි. අපි අද ඒ නොදනිමු. එහෙත් අනාගතයෙහි යම් දිනෙක යම් කිසිවකු ඒ ප්‍රශ්නයට වෙනත් ම පිළිතුරක් දෙනු ඇත. එලෙස දිය හැකි පිළිතුරු රාශියක් වෙයි. අපි දැනට දී ඇති පිළිතුරු දෙක සළකා බලමු. ඉන් එක් පිළිතුරක ඇත්තේ ගුරුත්වාකර්ෂණ බලය පිළිබඳ සංකල්පය ය. එසේත් නැත්නම් ගුරුත්වාකර්ෂණ ක්ෂේත්‍රය පිළිබඳ සංකල්පය ය. අනෙක් පිළිතුරෙහි ඇත්තේ අවකාශ කාලයෙහි වක්‍රතාව (curvature of space - time) පිළිබඳ සංකල්පය ය. මේ සංකල්ප දෙක ම වියුක්ත වෙයි. සාධාරණ සංසිද්ධි (phenomena) පිළිබඳ ව ඉදිරිපත් කෙරෙන ප්‍රවාදවල වියුක්ත සංකල්ප අඩංගු වෙයි. සාධාරණ සංසිද්ධිය පවා ඉදිරිපත් කළ හැක්කේ වියුක්ත සංකල්ප ආශ්‍රයෙන් ය.

අපි අදාළ ප්‍රශ්නයට නැවතත් යමු. අප අසන්නේ අහවල් පොල් ගෙඩිය පොළොවට වැටුණේ ඇයි ද යන්න නොවේ. පොල් ගෙඩි පොළොවට වැටෙන්නේ ඇයි ද යන්න ද නොවේ. අතීතයෙහි පැවති, වර්තමානයෙහි පවතින, අනාගතයෙහි පැවතිය හැකි සියළු ගෙඩි වර්ග ගැන පමණක් නොව ගල්කැට වැනි දෑ හා ඛගෝලීය ඉර හඳ ආදිය ගැන ද ප්‍රශ්නය යම් ආකාරයකට වලංගු වෙයි. දැන් අපට පොල් ගෙඩිය, ගල් කැටය ආදිය ගැන වෙන වෙන ම සඳහන් කළ නොහැකි ය. එබැවින් ඒ සියල්ලට ම වස්තුව (object) යන වචනය - සංකල්පය යොදා ගනිමු. වස්තුව යන්න වියුක්ත සංකල්පයකි. වස්තුව යන්න අපට සිතෙහි මවාගත හැක්කක් නොවේ. ඒ සඳහා චිත්ත රූපයක් නොපවතියි. වස්තුවක් යනු පොල් ගෙඩි, ග්‍රහ වස්තු, ගස් වැල්, ආදී සියල්ලට ඇති පොදු ගුණයකි. චිත්ත රූප නොමැති සංකල්පවල පදනමේ ඇත්තේ යෙහෝවා නම් යුදෙව් දෙවියන් වහන්සේ ය.

© Prof. Nalin De Silva

ඒ දෙවියන් වහන්සේට සිරුරක් නැත. ගණ දෙවියන්, විෂ්ණු දෙවියන්, කතරගම දෙවියන් ආදීන්ට පමණක් නොව සක් දෙවිඳුන්ට ද සිරුරක් ඇත. ඒ දෙවිවරුන්ගේ චිත්‍ර ඇත. එමෙන් ම ඒ දෙවිවරුන්ගේ ප්‍රතිමා ද වෙයි. එහෙත් යෙහෝවා දෙවියන් වහන්සේට සිරුරක් නැත. අපට යෙහෝවා දෙවියන් වහන්සේ ගැන චිත්ත රූපයක් ඇතිකර ගත හැකි නොවේ. මේ යෙහෝවා දෙවියන් වහන්සේ යනු කවු ද? යෙහෝවා දෙවියන් වහන්සේ ගැන සඳහන් වන්නේ බයිබලයේ පරණ තෙස්තමේන්තුවෙහි ය. ලෝක නිර්මාණය ඒ දෙවියන් වහන්සේගේ කාර්යයක් ලෙස එහි සඳහන් වෙයි. අද වන විට ඒ දෙවියන් වහන්සේ යුදෙව්, ක්‍රිස්තියානි ආගම් අදහන බැතිමතුන්ගේ දෙවියන් වහන්සේ බවට පත් වී ඇත. ඒ සියළු දෙනාම ලෝකය මැව්වේ ඒ දෙවියන් වහන්සේ යැයි විශ්වාස කරති. ඉස්ලාම් ආගම අදහන බැතිමතුන් අල්ලා දෙවියන් වහන්සේ ලෙස හඳුන්වන්නේ ද ඒ දෙවියන් වහන්සේ ම ය. මුස්ලිම් බැතිමත්තු ද පරණ තෙස්තමේන්තුව පිළිගනිති. පරණ තෙස්තමේන්තුවේ දැක්වෙන ආකාරයට යෙහෝවා දෙවියන් වහන්සේ අදහන අය වෙනත් රටකට ගොස් එය යටත් කර ගැනීමෙන් පසුව පළමුවෙන් කළ යුතු කාර්යයක් නම් ඒ රටේ මිනිසුන් අදහන දෙවියන්ගේ පිළිම කඩා බිඳ දැමීම ය. එය යෙහෝවා දෙවියන් වහන්සේ ගේ අණ පරිදි සිදු වන්නකි.

වත්මන් ලෝකයේ පදනම පරණ තෙස්තමේන්තුව බව බොහෝ දෙනාට නොතේරෙන, එයටත් වඩා ඔවුන් පිළිගැනීමට අකමැති කරුණක් වෙයි. ඊනියා නූතනත්වයේ පදනමෙහි පරණ තෙස්තමේන්තුව වෙයි. ඒ හැරෙන්නට ඊනියා නූතන ලෝකයේ ඇත්තේ පැරණි ග්‍රීක චින්තනයෙන් ලබාගත් අංග කිහිපයකි. නූතනත්වය යැයි කියා ගන්නා දෙය පමණක් නොව ඊනියා පශ්චාත්නූතනවාදයේ ද පදනම පරණ තෙස්තමේන්තුවේ හා ග්‍රීක චින්තනයේ අංග ය. මෙය විස්තරාත්මක ව නැවත නැවත කිව යුතු කතාවකි. නූතන බටහිර ලෝකයේ මුල් ඇත්තේ පැරණි බටහිර ආසියාවෙහි, විශේෂයෙන් ම පලස්තීනයෙහි හා අවට ප්‍රදේශවල හා පැරණි ග්‍රීසියෙහි ය. එවැනි මුල් ඇති බටහිරයන් හා බටහිර දැනුම අනුකරණය කිරීම හැර අන් කිසිවක් නොදත් මෙරට ඇංකර දීනයෝ බටහිරයන්ට හා ඔවුන්ගේ දැනුමට වන්දනාමාන කරමින් අප අපේ මුල් සොයා අනුරාධපුරයට යා යුතු යැයි පවසන විට අතීතකාමයක් ගැන කතාකරති. මේ අතීතකාම කතාව ද වත්මන්කාම බටහිරයන් විසින් අනුකාරක ඇංකර දීනයන්ට තනා දී ඇති තවත් කතාවක් පමණකි. අප අපේ මුල් සොයාගෙන අපේ ප්‍රවාද ගොඩනගන විට බටහිර දැනුම් ආධිපත්‍යය ද බිඳ වැටෙන බව දන්නා බටහිරයෝ ඔවුන්ගේ ඒජන්තයන් වූ ඇංකරයන්ට එවැනි කතා තනාදෙති. ඇතැමුන්ට අනුව මුල් සොයා අනුරාධපුරයට යන්නෝ ලිං මැඩියෝ වෙති.

අපේ මුල් සොයා අනුරාධපුරයට යෑම අතීතකාමී වුවක් හෝ ලිං මැඩි ක්‍රියාවක් හෝ ලෙස හඳුන්වන්නෝ තමන් මහත් බැතියෙන් අදහන (එය ඇදහීමකි) බටහිර දැනුමේ මුල් ඇත්තේ පැරණි පලස්තීනයෙහි හා පැරණි ග්‍රීසියෙහි බව නොදන්නාවූ ද  බටහිර කාක්කන්ගේ ගොදුරු බවට පත්වන්නා වූ ද ලිං මැඩියෝ ම වෙති. අඩුම තරමින් ක්වොන්ටම් භෞතිකය දන්නා ලිං මැඩියකුට ක්වොන්ටම් විභව ලිඳ (quantum potential well) පසාරු කර ගෙන ගිය හැකි ය. ඒ පසාරු කිරීමේ කතාව අයත්වන්නේ බටහිර ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයට නොව සිංහල ථෙරවාද බෞද්ධ චින්තනයට හා තවත් චින්තන කිහිපයකට ය. නිව්ටෝනීය ලෝකයක හිර වූ ලිං මැඩියන්ට බටහිර කාක්කන්ගේ කටේ එල්ලී ගමන් කිරීම හැර වෙනත් දෙයක් ගැන සිතා ගැනීමටවත් නොහැකි ය. මේ ලිං මැඩියන්ගේ ගමන අවසාන වන්නේ කාක්කන්ගේ ආහාරය බවට පත්වීමෙනි.

අපට අවශ්‍ය වන්නේ මේ ලිං මැඩියන් ගැන කතා කිරීම නොව යෙහෝවා දෙවියන් වහන්සේ ගැන කතා කිරීම ය. ඉතා පැහැදිලිව ම උන් වහන්සේ ගේ ස්වරූපය සිතා ගත නොහැකි ය. එයට හේතුව උන් වහන්සේට පැහැදිලිව ම සිරුරක් නොමැති විම ය. පරණ තෙස්තමේන්තුවට අනුව යෙහෝවා දෙවියන් වහන්සේ සමග සම්බන්ධ විය හැක්කේ කඳු මුදුන්වල ය. එමෙන් ම එයට අනුව යෙහෝවා යන්නෙහි තේරුම ජ්වලිත හෙවත් දිළිසෙන යන්න ය. මේ කරුණුවලින් අපට සිතාගත හැකි දෙයක් නම් යුදෙව්වන් ඈත අතීතයේ තම ගෝත්‍රික දෙවියන් වහන්සේ ලෙස විදුලි කෙටීම තෝරා ගෙන ඇති බවත් එය කල් යෑමේ දී යෙහෝවා දෙවියන් වහන්සේ බවට පත්වී ඇති බවත් ය. ඈත අතීතයේ ජීවත් වූ මිනිස්සු විවිධ වස්තුවලට දේවත්වය ආරෝපණය කළහ. යෙහෝවා දෙවියන් වහන්සේ එසේ විදුලි කෙටීමට දේවත්වය ආරෝපණය කිරීමෙන් ලබා ගත්තක් වීය හැකි ය. බටහිර ආසියාවේ කාන්තාරවල විසූ යුදෙව්වන්ට විදුලි කෙටීම ඉතා වැදගත් වූවාට සැකයක් තිබිය හැකි නොවේ.

© Prof. Nalin De Silva

යෙහෝවා දෙවියන් වහන්සේට ශරීරයක් නැති වීමෙන් ද විදුලි කෙටීම හා උන් වහන්සේ අතර ඇති සම්බන්ධය ගැන යමක් කියැවෙයි. ඉර හඳ වැනි දේවත්වය ආරෝපණය කරන ලද වෙනත් බොහෝ වස්තු මෙන් නොව විදුලි කෙටීමට නිශ්චිත ස්වරූපයක් නැත. විදුලි කෙටීමෙහි රූප ඇඹිය හැකි නොවේ. එබැවින් යෙහෝවා දෙවියන් වහන්සේගේ රූප හෝ ප්‍රතිමා නැති වීම ද පුදුමයට කරුණක් නොවේ. මෙහි එක් වැදගත් කරුණක් නම් යෙහෝවා දෙවියන් වහන්සේ වියුක්ත වීම ය. උන් වහන්සේ ගැන චිත්ත රූපයක් මවා ගත හැකි නොවේ. යුදෙව් සංස්කෘතිය වියුක්ත සංකල්පවලට තිබූ ආකර්ෂණය ද මෙහි දී වැදගත් වෙයි.

මුල දී යුදෙව්වන්ගේ ගෝත්‍රික දෙවියන් වන්නට ඇතැයි සිතිය හැකි යෙහෝවා දෙවියන් වහන්සේ පසු කලෙක ක්‍රිස්තියානි, කතෝලික, ඉස්ලාම් ආදී ආගම් විසින් ද තම තමන්ගේ දෙවියන් වහන්සේ ලෙස සලකනු ලැබිණි. ඒ දෙවියන් වහන්සේ වියුක්ත වීම නිසා ද එලෙස වෙනත් අයට ද ඔවුන්ගේ සංස්කෘතීන්ට උන් වහන්සේ අවශෝෂණය කර ගැනීම අපහසු කරුණක් නොවූ බව පැහැදිලි ය. එය තවත් අයුරකින් කියන්නේ නම් යුදෙව්වන්ට තම ගෝත්‍රික දෙවියන් වහන්සේ අන් අයට ද දී ඒ දෙවියන් වහන්සේ ගෝත්‍රිකත්වයෙන් මුදවා මුළු ලෝකයට ම පොදු වූ දෙවියන් වහන්සේ කෙනකු කිරීමට හැකි වී තිබේ. යුදෙව් සංස්කෘතියෙහි මේ අන් අයට ද දීම යෙහෝවා දෙවියන් වහන්සේට පමණක් සීමා වී නැත. එය අද සමස්ත දැනුමට ම බලපායි. අද බටහිරයන් උරුම කර ගෙන ඇත්තේ යුදෙව් චින්තනය පදනම් කරගනිමින් දැනුම නිර්මාණය කිරීම හා එසේ නිර්මාණය කරගත් දැනුම අනෙක් අයට ද බෙදා දීම ය. අද අප ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය ලෙස හඳුන්වන චින්තනයෙහි විශාල කොටසක් යුදෙව් චින්තනයෙන් ලබාගෙන ඇත. යුදෙව්වන් වියුක්ත යෙහෝවා දෙවියන් වහන්සේ අනෙක් ආගමිකයනට ද ලබා දුන්නාක් මෙන් ඔවුන්ගේ වියුක්ත චින්තනය ද ලබා දී ඇත.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva